# ඉංදියාව: මාඕවාදී කඳවුරක ඇතුලාන්තය වෙත බැල්මක්

PLGA කඳවුරක් පිළිබඳව ඉතා වැදගත් විස්තරයක් මෙහි දැක්වේ. නමුත් ඉන් කියවෙන්නේ ඉන්දියානු භූමියෙන් 1/3 ක් රතු කොරිඩෝවක් ලෙස මාඕවාදීන් විසින් පාලනය කරන බවයි. එය දකුණු ඉන්දියාවේ තමිල්නාඩුවේ සිට නේපාල සීමා මායිම දක්වා විහිදේ; නැගෙනහිර සහ මධ්‍යම ඉන්දියාවේ ආදිවාසීන්ගේ ගම් දනවු යටින් දිවෙන ''හරිත දඩයම් මෙහෙයුම'' (Operation Green Hunt) සාධාරණීය කෙරෙන වාතාවරණයක් නිර්මාණය කරන ඉන්දීය මාධ්‍ය තුළින් මාඕවාදීන්ගේ ශක්තිය අතිශයෝක්තියට නගමින් පවතී.

වර්තමාන ඉන්දියාවේ භූමියෙන් 1/3 ක් මාඕවාදීන් විසින් රතු කොරිඩෝවක් ලෙසින් පාලනය කරනු ලැබේ.




## මාඕවාදී කැරලිකරුවන්ගේ වන ලෙන (Jungle Lair)

**ඉංදියාව, මී(ර්)ටර් (Mirtur) වන පෙදෙස:** වයස 20 ක පමණ කෙසඟ සිරුරක් ඇති සහෝදර විජේ, රයිෆල් එක පැත්තකින් තබාගෙන, තම කූඩාරම තුළ තිබෙන අබලන් වූ ගුවන් විදුලි යන්ත්‍රය BBC හින්දු සේවයට හරවමින් සිටියේ ය. චට්ස්ගා(ර්)වල, රැජ්නන්ගඔන් (Rajnandgaon) දිස්ත්‍රික්කයේ නැක්සලයිට් හෝ මාඕවාදී කැරලිකරුවන් විසින් ගැමියෙක් මරා දමා ඇත, යන ප්‍රවෘත්තිය මෙම ගුවන් විදුලිය මගින් නිවේදනය කළහ. ඔහුගේ ඇස් බැම් හැකිළුණි; ''සාධාරණ හේතුවක් නැතිව අපේ මිනිස්සු කාවවත් මරන්නේ නැහැ. අඩු තරමින් මිනිහා පොලිස් ඔත්තුකාරයෙක් වත් වෙන්න ඕනේ.''

බිජාපූර් දිස්ත්‍රික්කයේ චට්ස්ගා(ර්)වල මාඕවාදී විප්ලවවාදී හට කණ්ඩායමක නියෝජ්‍ය අණ දෙන නිළධාරී, සහෝදර විජේ සිත් ගන්නා සුළු අයුරින් බස හැසිරවීමේ කුසලතා පූර්ණය. ''විප්ලවයක උත්තේජයකින් තොරව ලෝක අසාධාරණකම් ඔබට නිමා කිරීමට පුළුවන් කමක් නෑ'' ඔහු කීවේ ය. ''දෑත් වල ලේ නොතැවරෙන කිසිදු විප්ලවයක් සිදු වන්නේ නෑ. අපි ජනතාවගේ යුද්ධයක් කරමින් සිටිමු, එය දිග්ගැස්සුණු මහජන යුද්ධය යි.''

පෙරදා රැයේ ඇද හැලුණු අනෝරා වැස්සෙන් සේදීගිය, නැළවෙන කුරුළු නාදය පැතිර යන, මෘදු හිරු රැ ස් තුරු වියන් අතරින් පෙරී මිහි කත සිප ගන්නා කඳු මුදුනේ, වන එළිමහනේ අණදෙන නිළධාරියා සහ ඔහුගේ සහෝදරයින් අවදිව සිටී.

වයස අවුරුදු 15 ක් පමණ වෙන තරුණයන් සමග ගැහැණු පිරිමි, ප්ලාස්ටික් ඇතිරිලි අතුරා සකස් කරන ලද කහ පැහැති කූඩාරම් 3 කින් එළියට එමින් සහ ඇතුලට යමින් සිටියහ. ලුංගි හැඳි පිරිසක්ද, ඉණතෙක් දවටා රෙදි කඩක් හැඳි කීප දෙනෙක්ද, සමහරු ටී ෂර්ට් හා යුධ නොවන කටයුතු වලට අඳින කොමාන්ඩෝ සෙබළ ඇඳුම් වලින් සැරසී ඔප දැමුණු බුලට්ස් ලිහිල්ව දවටා ඉණ වටා බැඳි පතරොම් පටි හා රයිෆල් උරහිස් මත රුවා ගෙන සිටියහ.

ඉන්දීය රජය නැක්සලයිට්වරුන්ට එරෙහිව ප්‍රතිප්‍රහාරයන් සැලසුම් කිරීමට පෙර, පුරවැසියෝ ඉංදියාවේ මාඕවාදීගේ ඉහළ ක්‍රියාකාරීත්වයක් තිබුණු දකුණු චටිස්ගා(ර්)වල ඝන කැලෑවල පිහිටි කැරලි කරුවන්ගේ රහසිගත ලැගුම් හල් වෙත පිය මැනීය. කැරලි කරුවන්ගේ කෙන්ද්‍රීය නැවතුම් පළවල් වලට, බයිලාඩිලා (Bailadila) කඳුවැටිය වටා වටරවුම් වලින් ගහණ, ගරිල්ලා කැරලි කරුවන් විසින් පාලනය කරන ගම්මාන හරහා වැටී තිබෙන දුෂ්කර මාර්ග දිගේ 70km පමණ දුරක් පා ගමනින් යා යුතුව තිබුණි. මෙම ගම්මාන මාඕවාදීන් විසින් හැඳින්වුයේ ''විමුක්ති ග්‍රාමයන්'' (Liberated Villages) ලෙසය.

බොහෝ දුරට ධනවාදී ලෝකය තුළ මෙන්ම, චීනය තුළද, මාඕ සේතුං නාමයට එතරම් අරුතක් ඇත්තේම නැත. නමුත් ඈත දුෂ්කර, අසහනකාරී වනාන්තරවල පිහිටි ගම්මාන වල ''මාඕ දෘෂ්ඨිවාදය'' තවමත් මෙහෙයුම් මූල ධර්මයක් (guiding principle) වෙයි. ආයුධ සන්නද්ධ විප්ලවයක් මගින් රාජ්‍ය පෙරලා දමා පංති රහිත සමාජයක් නිර්මාණය කිරීමේ ධර්මතාව තුළ නැක්සලයිට්වරු දැඩිව එල්බගෙන සිටිති.

මෙම යුද්ධය පිළිබඳ බොහෝ තතු අදෘශ්‍යමානයි, ඉන්දියානු පිටිසර බද පළාත්වල මෙය අතිශය වේදනාකාරී වෙයි. ඉන්දියාවේ ප්‍රාන්ත රාජ්‍ය 28 න් 22 ක සුළු ආරම්භයක් සහිතව, ඉන්දීය භූමි ප්‍රමාණයෙන් 1/3 කට ආසන්න ප්‍රමාණයක් කැරලිකරුවන් විසින් පාලනය කෙරේ. පසුගිය වසර වලදී ඉන්දියාවේ තියුණු ආර්ථික වර්ධනය නැගී එන සුපිරි බලවතෙක් බවට පත්ව ඇති නමුත් පොහොසතුන් හා දුප්පතුන් අතර දැඩි පීඩාකාරී පරතරයක් ද නිර්මාණය කර තිබේ. නිරීක්ෂකයින් පවසන පරිදි නැක්සලයිට්වරු වනාහි ඉන්දියාවේ වර්ධනය වන සමාජ අසමානතාවයේ සංකේතයකි. කැරලි කරුවන් විසින් පාලනය කරන ගෝත්‍රික ප්‍රදේශ වැඩි ප්‍රමාණයක් අන්ත දිළිඳු බවට පත් කරන ලද ප්‍රදේශ වුවත්, සූරාකෑමට ලොල්වූ ආර්ථික වර්ධනයට කෑදර, ඛණිජ සහ ස්වාභාවික සම්පත්වලින් පොහොසත් ය.

ඉන්දියාවේ ඉඩම් අයිතිය අභිමිකරනු ලැබුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින කැරලිකරුවෝ, රජය විසින් ජනතාව සිය ඉඩම් වලින් ඉවතට තල්ලු කර දැමීමට කටයුතු කරනවා යැයි චෝදනා කරති.

ඉන්දීය අගනගර හා නාගරික මධ්‍යස්ථාන වල, දීර්ඝ කාලයක් තිස්සේ, වැඩි වශයෙන් නැක්සලයිට්වරුන් දැක තිබුණොත් මධ්‍යස්ථ යුධමය විභවතාවයක් සහිත අසංවිධිත ග්‍රාමීය භේවාපන්නයක් (militia) ලෙසයි. නමුත් මෑතක සිට ඔවුන්ව දර්ශන වී තිබෙන්නේ බරපතල තර්ජනයක් වශයෙනි. ඔවුන්ගේ ප්‍රසාරණය වන ''රතු කොරිඩෝව'' භීතිය ජනිතකර තිබේ. එනම් වර්ධනය වන මාඕවාදී මැදිහත්වීම ඉන්දීය ආර්ථික වර්ධනය දුර්මුඛ කිරීමට හැකි බවයි.

මේ වසරේදී ඉන්දීය අගමැති මන්මෝහන් සිං කිවේ ''ස්වාභාවික ඛණිජ සම්පත් බහුලව තිබෙන ප්‍රදේශවල වාමාංශික අන්තවාදීන්ට සරුව වැඩීමට ඉඩ දුනහොත් ආයෝජන අවස්ථාවන්ට ඇත්ත වශයෙන්ම අහිතකර බලපෑමක් ඇති වේ''

ඉන්දියාවේ යපස් නිධි වලින් 1/5 ක ප්‍රමාණයක් තිබෙන දකුණු චටිස්ගා(ර්)වල හාත්පස විහිදී යන මෙම වනගත පළාත්, එසාර් වානේ (Essar steel), ටාටා වානේ (Tata steel) වැනි කලාපය තුළ ඉහළ යන සිය වානේ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය කැණීමට උනන්දුවක් දක්වන ධනවත් වානේ නිෂ්පාදිත සමාගම් වලට විකුණා දැමීමට මධ්‍යම ආණ්ඩුව ක්‍රියා කරන බවට කැරලිකරුවෝ චෝදනා කරති.

පසුගිය වසරේ ජුනි මස, මාඕවාදී ගරිල්ලන් දන්තැවාඩ හි පිහිටුවා තිබුණ Essar Steel යපස් කර්මාන්ත ශාලාවල තාක්ෂණික උපකරණවලට අලාභ හානි කරමින්, සකස් කරන ලද උකු මිශ්‍රණය බෙංගාල් බොක්ක කරා රැ ගෙන යන 270km දිගට පොළොව යටින් දිවෙන නළ පද්ධතිය විනාශ කරමින් ලොරි 19 ක්ද ගිනි බත් කළේය. සිය සහෝදරයින් සමග මෙම මෙහෙයුම දියත් කළ විජේ සහෝදරයා කියා සිටියේ, ''අපේ භූමිය අත්පත් කර ගන්ට අපි ඔවුන්ට කිසිදාක ඉඩ නොතබමු.''

''මේ අපේ එක් ආකාරයක ප්‍රධාන යුධමය ශක්තීන්ගෙන් එකක්'' යැයි සහෝදර විජේ පැවසුවේ සිය කූඩාරම තුළ තිබෙන වානේ පෙට්ටියකට තට්ටු කරමිනි. ඒ තුළ කිලෝග්‍රෑම් 5 ක් බරැති අධි බලැති පිපිරුම් උපකරණයක් තැනීමට අවශ්‍ය පුපුරණ ද්‍රව්‍ය විය. ''ජීප් රියක් පුපුරවා දැමීමට මේ ටික ප්‍රමාණවත්'' ඔහු පැවසීය. ''මේවායේ කිලෝග්‍රෑම් 40 කින් පිපුරුම් වලට ප්‍රතිරෝධය දක්වන වාහන පවා අපි පුපුරවා දැම්මු.''

පසුගිය අර්ධ දශකය තුළ කැරලිකරුවන් විසින් මෙවැනි පිපිරුම් උපකරණ දහසකට වැඩි ප්‍රමාණයක් චටිස්ගා(ර්)වල පුපුරවා ඇත. කැරලිකරුවන් සමග පැවති මුහුණට මුහුණලා විවෘත සටන් වලදී බොහෝ පොලිස් භටයින්ට, පොලිස් උගුල් (Boby trap) වැනි උපක්‍රම වලදී සිය ජීවිත අහිමි විය. AK-47 සහ ඉන්දීය ජාතික අවි පද්ධතිවල ප්‍රහාරක රයිෆල වැනි අති නවීන අවි ආයුධ වලින් ඔවුහු සන්නධව සිටිති.

කඳවුර අසල, ගිනි මැලය වටා රැස්වන කැරලිකරුවෝ, මළ නොබැඳෙන වානේ භාජන වලින් තේ පානය කරති. කැරලිකරුවෝ උජාරුවෙන් පවසා සිටියේ අවට පොලිස් ස්ථාන වටලා කළ මෙහෙයුම් වලින් මෙම රයිෆල් තොගය උදුරා ගත් බවයි. ඔවුන්ගේ උණ්ඩ වලින් ඩැහැ ගැනිමේ සංඥා නිකුත් වෙයි. එක් කැරලි කරුවෙක් අතවූ පතරොම් තොගය, අවුරණයේ වුයේ ''Ammunitiom Factory Khadk'' යනුවෙනි; ඒ ඉන්දියානු ආරක්ෂක සේනාංකවලට අවි සපයන ආයුධ සේවා සැපයුම් අංශයකි.

බොහෝ කැරලිකරුවන් වයස අවුරුදු 18 ට අඩු අතර ඔවුන් මාඕවාදයේ දැඩි දර්ශනයෙන් අධිශික්ෂණයකට පත්ව සිටින බව පෙනෙන්නට තිබේ. වයස 16 ක් පමණ කුඩා සහෝදර මොහාන් වැනි සමහරෙක් ඉරණම මත විශ්වාසයෙන් බැහැරව, රජයට එරෙහිව ගෙනයන යුද්ධයට අති මහත් උද්වේගයක් උනන්දුවක් ජනිත කරති. රජය සිය ජනතාවට අපරාධ සිදුකර ඇති බව මොහාන් වැනි ලාබාල තරුණයෝ විශ්වාස කරති.

නැක්සලයිට් විරෝධී - රාජ්‍ය අනුග්‍රහය ලද සන්නද්ධ කණ්ඩායමක් වන සල්වා ජුදුම් (Salawa Judum) විසින් මොහාන් ජීවත් වූ ගම්මානය ගිනි තබා විනාශ කිරීමෙන් පසු බස්තාර් දිස්ත්‍රික්කයේ ගමකින් ඔහු නැක්සලයිට් ව්‍යාපාරයට සම්බන්ධ වී ඇත්තේ වයස අවුරුදු 12 දීය. ගොවියෙකු වන ඔහුගේ පියා, මව සහ සොහොයුරා යන්තම් අනතුරක් නොවී ගැලවී ගත්තත්, යටත් කරගෙන සිටීම නිසා මොහාන් උරණ වී සිටියහ. ඔහු සම්බන්ධ වුයේ නැක්සලයිට් ළමා පාර්ශවයක් වන බාල් සංගම් (Bal Snagham) ඒකකයටයි. අනික් කැරලි කරුවන්ට මෙන්ම, ඔහුද කිසිදු වේතනයක් නොලබන අතර එකම ප්‍රතිලාභය වූයේ විමුක්තිය යි. ඔහු මාස තුනක් මාඕවාදී කඳවුරක ගතකර ඇත. සතරවන මාසය වන විට, ඔහු තුවක්කුව තුරුලු කරගත්තේ ව්‍යාපාරය වෙනුවෙන් මරණයට වුවද සූදානම් වන බව පවසමිනි. මගේ පියා කිව්වා, ''පුතේ අරගලයේදී උඹේ ජීවිතය අහිමි වුවහොත් මගේ අනිත් පුතාවත් අරගලය වෙනුවෙන් පරිත්‍යාග කරනවා'' යැයි ඔහු සිනා මුසුව පැවසීය. ''මාගේ ජනතාව උදෙසා මරණයට, වෙඩි උණ්ඩයට මුහුණ දීමට මම දැන් සූදානම්...''

වන කඳවුරු තුළ ඔහු වගේ බොහෝ තරුණයින් සිටියහ. තවත් කීප දෙනෙක් රිහිමාති සහෝදරිය වටා එලන ලද ප්ලාස්ටික් ඇතිරිලි මත වාඩිවී ඇය කියවන, පිට කවරයෙහි දෑකැත්ත සහ මිටිය මුද්‍රණය කළ පොතට සවන් දෙමින් සිටිති. එම කථාවේ අන්තර්ගතය වූයේ අරගලයේ සිය ගණන් ජීවිත පරිත්‍යාග කළවුන්ගේ සටන්කාමී ජීව ගුණයයි. ''මෙය තුවක්කුවේ විප්ලවය සහ දේශපාලනයයි'' යනුවෙන් යුධමය අංශයේ අණ දෙන නිලධාරී රිහිමාති සහෝදරිය පවසා සිටියාය. ''අපි අපේ නායකයින්ගේ පරිත්‍යාග ගැන අපේ සහෝදරයින්ට උගන්වමු, එමගින් වනය තුළ ගත කරන දුෂ්කර ජීවිතය දරා සිටින්නට ඔවුන්ට ධෛර්යයක් ඇති වේ.''

කැරලිකරුවෝ ඉවුම් පිහුම්, පිරිසිදු කිරීම් සහ මුර සේවයේදී සංවිධානගත බව සහ විනයගරුක බව ප්‍රදර්ශනය කරන බව පෙනුණි. කැලයට අඳුර වැටෙද්දී ගිනි දැල්වීම මගින් තමන් සිටින ඉසව්ව සතුරාට දැනෙන බැවින් රාත්‍රිය එළඹීමට පෙර ඉවුම් පිහුම් අවසන් කළ යුතු බව විජේ සැලකර සිටියි. කඳවුර වටේ ඇති මුර කපොලු හයට දෙදෙනා බැගින් මාරුවෙන් මාරුවට මුර සේවයේ යෙදීමට ඔහු පිරිස පත් කළේය. කෙනෙක් වාඩිවී සිටින අතර අනෙකා සිටගෙන සෙවිල්ලෙන් පසු වෙයි. සතුරා ළං වුවහොත්, සහෝදරවරුන්ගෙන් කෙනෙක් නැගිට වෙඩි තැබිය යුතුවන අතර කණ්ඩායමේ ඉතිරි අයව වහාම දැනුවත් කරන්නට සිදු වේ. හැමදාම කටයුතු කරන පරිදි, සහෝදර විජේ කඳවුර වටේ සැරිසරන විට කියා සිටියේ හමුදා ප්‍රහාර වලින් ගම්මුන්වත් ඔහුගේ පිරිසවත් ව්‍යාකූල නොකළ යුතු බවයි.

අළුයම, අසල්වැසි ''විමුක්ති ග්‍රාමවල'' ජනයා වැල නොකැඩී කඳවුර වෙත ඇදී එමින් එහි කූඩාරම් තුළ අසුන් ගනිති. ඔවුන් සිය සිතැගි පරිදි එනවාද, නැතිනම් බල කිරීම මත අධිශික්ෂණ සැසි සඳහා එනවාද යන්න පැහැදිලි නැත. රෑ බෝවෙන තෙක්, මෘදු තෙපුල් ඇති, ප්‍රාදේශීය ගෝන්දි උප භාෂාව පමණක් කථා කරන, සේනා ඒකකයේ අණදෙන්නා වන විජේ, ඔවුන් සමග සාකච්ඡාවට අසුන් ගනී.

ඉදිරියේදී සිදුවිය හැකි මිලිටරි මෙහෙයුම් වලදී ''ස්වයං ආරක්ෂක උපක්‍රම'' ජනතාවට උගන්වමින් සිටින බව විජේ පැවසුවේය. ''ඔබ අලි රංචුවක් පලවා හරින විදියට'' පහරදීමෙන් සහ දීවීමෙන්, ගරිල්ලා ක්‍රමයෙන්, දුන්නෙන් සහ ඊතලයෙන්, මන්නා පිහි වලින්, හැකියාව ඇති අය ගිනි අවි වලින් සතුරා පළවා හැරීමට ගම්වැසියන් උගත යුතුයි. සමහර අය ''ආක්‍රමණික හමුදාවන්ගෙන්'' ආරක්ෂාවීමට වැඩි දියුණු කළ පුපුරණ ද්‍රව්‍ය භාවිතා කරන අන්දම උගත යුතුයි. මේ ආදිවාසී මිනිසුන්ට අකුරු කියවීමට හැකියාව නැහැ, නමුත් ඉන්දියානු හමුදාව සමග සටන් කිරීමට ඔවුන්ට හැකියාව ඇත.

''මීට පෙර, ඉන්දීය රජය විශේෂ බල ඇණි කිහිපයක්ම එවා තිබුණි. ඔවුහු අහිංසක මිනිසුන් මරමින් ගම්මාන ගිනි තැබූහ. නමුත් ඔවුන්ට මුලමනින්ම අපව විනාශ කිරීමට නොහැකි විය.'' ඔහු කීවේය. ''මෙවර ඔවුන් ජය ගනී යැයි සිතන්නේ කුමකින්ද?''

------------

මෙම ලිපිය, ''දකුණු ආසියාවේ විප්ලවය'' (Revolution in South Asia) {southasiarev.wordpress.com}, නැමැති ජාත්‍යන්තරවාදී තොරතුරු ව්‍යාපෘතියේ; 2009, නොවැම්බර් 15 කා ෆ්‍රෑන්ක් (Ka Frank) විසින් පළ කරන ලදි.

පරිවර්තනය NMSG
T 12

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com